


රස යුස උරා බී මිහිකත සතුව ඇතී
සවි බල ලබා තනිවම මහ ඉහළ නැගී
තුරු, අත්විදා මල්පල බර සිරස සැදී
හිරු සඳු පහස ලැබ අබිමානයෙන් හිඳී

අපුලය පෙවෙත බිම් පණුකැල සමග ගැලී
වැල හිස නගයි සවිමත් තුරු බඳෙක වෙළී
හිරු රැස් බිඳුව විදිමින හිඩැසකින් සැලී
ඔසු වග අගන වෙත සැනැහී පසෙහි කිලී

**පද්මසිරි හේරත්**
වෙරිබි වික්ටෝරියා




## ලෙංගතු සිත

සංසාර පුරුද්දට බැදුණු ආදරේ
සිතෙහි දරාගෙන සිටින්නම්
සදාකල්හිම ඔබ හද අරණේ
ලැගුම්ගෙන මා හිඳියි නම්

සුවඳ තැවරූ සමනල් මාවත
මල් පාවඩක් සේ දිලෙයි නම්
නොවී නෙතගට උණු කඳුළු බිඳු
ගත වෙලෙන උණුසුම මගෙම නම්

ගීතයක් ඔබ මගේ දිවියට
එහි තනුව වී මා හිදින්නම්
නුඹට ඇදහිය නොහැකි තරමට
ආදරේ මගෙ පුදන්නම්

**ගංගා සජීවනී කලුපහන**

## පාළු ගෙදර

සාලෙ මහ පුටුව ඇත
ඉඳගන්න කෙනෙක් නැත
බුමුතුරුණු පලස් ඇත
පා තබන කෙනෙක් නැත
විසල් මහ මැදුර ඇත
එහි වසන කෙනෙක් නැත
බැඳගත්ත බෙරය ඇත
එයට තඩිලන යුවල ඇත
වෙහෙස වුණු ගත ඇත
නිදහසක් ඇත්තේම නැත

**ලක්ෂ්මී ගුණරත්න**

## වෙනස

සංස්කෘතිය ටා
පටහැනි නැතිවා
කියා සිතාලා
මේ දේ කරලා
හොඳ නැතුවා
නිහඬ වෙලා ඉඳලා
කාලය ගෙවිලා
රටින් පිට වෙලා
එන්න උනා
නිදැල්ලෙ ඉගිලෙනා
කිරිල්ලියෝ සොඳ
උපන් බිමේ කූඩු හදා
සතුටින් හිනැහිලා
සිටිනා
එහාට නරකා
මෙහාට හොඳා
ඇවිල්ලම ඕනා
බලන්න සොඳා
කිම වරදා
රටින් රටා
වෙනසා

ශ්‍රියානි ග්‍රේරුෑල්
ජර්මනිය

## මව්පිය සමර

දුගීවරු නැති අඩවියේ
දන් දෙනු කෙසේ..
තබා මිළ කොළ
සුසුදු අත මත
සුපිරි සුව දෙන මල් හලේ...

ලබා පොකුරක් සිතට සරිලන
සුවඳ හමනා සාවියේ...
කර නමා හිස බර ලෙසේ
වැඳ සමරූ උයනට
රිසි ලෙසේ....
තබා මත එලකයේ
ලියැවුණු නමින්
මව්පියවරු ලෙසේ ...
දෑත් බැඳ නිස්සද්ද වී
සිහි කරත් ගුණ කඳ සැකවිනේ..

බොහෝ වැඩ ඇති ලොවේ
තත්පර ලෙසයි ගත වුණේ
දිගු වූ කලෙකින්
නොවෙද මිතු තෙම
ඇසුරු සැණකදි හමු වුණේ..
තබා මව්පිය සමර පසෙකින්
ලැබුණී ඇරයුම සිතු ලෙසේ...
සළුත වූයේ සුහද හමුවට
බාබකිව් මධු සාදයේ...

සමන්ති ශ්‍රී නාමරත්න

***අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව***
***www.ketapathpawra.com***

## පියාණනී

දරු අට දෙනකුගේ දිවි මග කරට ගෙන
දිව රෑ දෙකේ වෙහෙසී දුක දරා ගෙන
වදනෙන් කියන්නට බෑ ගෙන ගිය සටන
එනමුත් ඔබ නොවේ ඒ ගැන සසල වුණා

බොරු වංචාව හොරකම් පිළිකුල් කරන
අනුනගෙ වැරදි නොසොයා දිවි කල් ගෙවුණා
අවිහිංසාව සමගිය සාමය පතන
යස පාඩමකි ඔබගේ ඒ දිවි ගමන

ඉගෙනුමෙ අගය පෙන්වා දී ගෙන වෙහෙසා
දිරිමත් කළා සිප්සත කරනට විමසා
නිතරම ඔවා දී දරුවන් හට මෙලෙසා
දිරිමත් කලා ජීවන මග සුව සලසා

කරුණා දයා ගුණයෙන් අප හැමට යොමා
මුර දේවතාවෙක් මෙන් අප රැක බැලුවා
ඔබගේ වියෝවෙන් අප සැම කලබල වූවා
සෝ දුක් කඳුළු අප දෙනෙතෙහි රැඳ වූවා

අප ණයගැතිය පියතුම ඔබගේ නමට
කෙදිනකවත් බැරිය ඒ ණය ගෙවන්නට
මතු භවයෙදිත් ඔබ අ ප හා එක් වෙන්ට
නොවක් හදින් පතනවා පිං දී නමට

සසරින් සසර දුක් කරදර නැති වේවා
භවයෙන් භවය සැප සම්පත් ඉතිරේවා
නිවන් මගට යන මං පෙත් බිහි වේවා
අප හැම පැතුම් මේ අයුරින් ඉටු වේවා..!

**සෙනෙහෙලතා රත්නායක**
ක්ලේටන්



## ආදර මැණිකේට

හරි සීතලයි මෙහෙ ඉවසන්න බැරි තරන්
උණුසුම ලබමි ඔබ පිළිරුව තුරුළු කරන්
මීළඟ නිවාඩුව තෙක් දින ගණන් කරන්
ඉම් ඒ වසර වෙයි දිගු කල්පයක් තරන්

ගත අපෙ වුවත් එකිනෙක ඈතක දුරක
සිත ඇත යා වෙලා ලෙස දම්වැල පුරුක
සපුමල් කුමරු එන බව ඔබ වෙත හනික
සතුටින් සැනසෙන්න මගෙ ඉඳුනිල් මැණික

මල් ඇත පිපී එක එක පාට විසිතුරු
සුවඳක් නොමැත පෙනුමෙන් පමණි පියකරු
නටුවෙහි පිරී ඇත කටු රුදුරු බියකරු
සුමිහිරි සමන් මල මගෙ සොඳුරු පිවිතුරු

සුව නිදි යහන කටු අකුලකි ඔබ නැතුව
කරනෙමි පහන් බොහො දින වල නිදි නැතුව
මේකද ජීවිතය අපි දෙදෙනා පැතුව
පවුලක සිහින වැළලෙද මුදලට නතුව

නොහඬනු මැණික මෙය කියවා කඳුළු සලා
සිතුවිලි විටෙක මගෙ හදවත සසල කළා
සැලසුම් කළ දිවිය දෙදෙනා එකතු වෙලා
යුතුකම ඉටුකරමි මැණිකේ නොපිරි හෙළා

**සරත් වීරසේකර**

# පහන් වැට

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

## හදවතේ ගීතය

සොරා ගෙන සිත මගේ
මටද මා හිමි නැතේ
සියුම් තත් බිඳ හදවතේ
ලැගුම් ගෙන ඔබ සිතේ

මුල් දුවා හදවත් ගසේ
මල් පිබිදුනා දස දෙසේ
දෙහදක් එක සේ සැලෙන සේ
බැඳී ඇත ලොවට රහසේ

හමා යන මද පවනෙ පාවී
හදේ පෙම් සුවඳ ගෙන යාවී
ඔබ මගෙයි මා ඔබෙයි කියාවී
මතු සසර පුරා අප හමු වේවී

**HKKC මධුෂානි**

## මා තනි වේ නම්..

**මේ භව කතරේ**
**අනාථ සසරේ**
**දෙහදක් ළං වන අතරේ**
**ඔබම ය මා සෙවූ ආදරේ**

**පාළු ලොවකදි මා තනි වේ නම්**
**විහිදාලන්න එළිය පහන් ටැඹක් සේ**
**දිනෙක මිණි මෙවුල ගිලිහී යා නම්**
**නොබලන් මදෙස රාගියෙකු සේ**

**සඳකැන් සළු පොරවා නිදන්නේ නම්**
**වයන්න වෙණ තත් සුපුන් නදක් සේ**
**සිදුහත් වී ඔබ බවුන් වඩයි නම්**
**මා වෙන්නම් සිල්වත් ඔබෙ යසෝදරා**

**මේ දිවි ගමනේ**
**සුපසන් බැඳීමෙන්**
**ආදරේ නාමෙන්**
**මිදෙන්න එපා මගෙන්...**

**කාන්ති වික්‍රමසූරිය**

## ආත්මාර්ථකාමී ප්‍රේමය

**කළු රෝස මලක් මත**
**ලේ බිඳක් ඉහී ඇත**
**ඉරුණු සමනල් තටුවක**
**රුඳුණු මුදු පියරු පොද**
**සැලේ මද සුළගට.**

**විකසිතව**
**සිනාසෙන**
**මල් පියලි**
**යා කරන**
**ඒ මලේ නාභියෙහි**
**දෙවඟනක්**
**සැඟව ඇත.**

**චන්ද්‍රිකා ද සිල්වා**




ලන්ඩන් අහසේ සඳ පායන විට
ඉරත් හැරෙනවා තනිය මකන්නට
අඳුර වැටෙන තුරු බලා සිටින විට
හෙටට එළි වෙලා කාටත් නොදැනිම

වැතිරෙන විට මා පුතු ළඟ සයනේ
දුවගෙ සිනා හඬ සවනත දැවටේ
හිමියන් වෙහෙසී ගෙට ගොඩ වෙන තුරු
උණුසුම් සිතුවිලි හද තුළ තනි වේ

තනිකම අතුරින් දරු දුක මතු වී
අප්පච්චීගේ සුවඳ දැනේ
කිරි කළ හතකට ණයක් ගෙවන්නට
අම්මා ඉදිකඩ හිඳිනු පෙනේ

බොරළු පාර ළඟ සෙනේලතාවට
පෙම් කළ ගිරවුන් නාද ඇසේ
ගමරට එන මට අවසර දෙනවද
දෙපා වඳින්නට මවුනි නුඹේ...

**සුධර්මා වීරක්කොඩි**
ලන්ඩන්

## සුසුම් තුළින්

සදාදර ණයගැතිව මගේ ලයේ උණු වෙනා
ලෙයට පණ පොවා සුසුම් තුළ ජීවත් කෙරූ
ලස්සන ළඳේ මා දෙනෙත් තුළ කිමිදී
මෑණියනි ණයගැතිය ඔබේ ඔය උණුසුමට

විඩාබර ඔබෙ දෙනෙත් රිදවයි මගෙ නුවන්
සෙනෙහෙබර ඔබ ලයේ පිරි ඇති ආදරය
දිවා රැය වෙහෙසෙනා නුඹෙ ඔය අත පය
ණයගැතියි ණයගැතිය පියාණනි ඔබ උණුසුමට

සියලු දුක් කොටස් කර විඳ දැරූ ඔය සිත් වලට
ආදරය මහා මෙරක් මෙන් බෙදා දුන් ඔය සිත් වලට
දිවා රැය නිදිවරා ගතිපු ඒ පිං වලට
ආදරෙයි මෑණියනි, පියාණනි ඔබ සැමට

සෙව්වන්දි - ජර්මනිය